සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# දේශපාලන විද්‍යාවේ මූලිකාංග - I

**13 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

උපදෙස් :- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

● **ප්‍රශ්න අංක 01 සිට 15 දක්වා වූ ප්‍රශ්න වලට සපයා ඇති ප්‍රකාශ පහ අතරින් හතරක් පමණක් නිවැරදිය. නිවැරදි ප්‍රකාශය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

(01) දේශපාලන විද්‍යාවේ ස්වභාවය වන්නේ,

A මිනිසා විසින් හැසිරීම් පිළිබඳව අධ්‍යනය කිරීම.
B විකාශය කිරීමේ දී කාලානුරූපව වෙනස් වීම.
C සමාජීය විද්‍යා විෂයයන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම.
D මූලික සංකල්ප සම්බන්ධව පොදු එකඟතාවයක් දක්නට ලැබීම.
E ශුද්ධ විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතා නොකිරීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(02) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ වන්නේ,

A ඡන්ද දායකයාගේ ඡන්ද චර්යාව.
B ව්‍යාපාරික ආයතනවල කළමණාකරණය.
C රාජ්‍යයන් අතර පවත්නා සබඳතාවල ස්වාභාවයන්.
D ආයතනික ව්‍යුහයන්ගේ තිල බල පද්ධතිය.
E තුළනාත්මක ආණ්ඩු ක්‍රමයන්.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(03) දේශපාලන විද්‍යාව අධ්‍යනය කිරීමේදී තුළනාත්මක අධ්‍යයන ක්‍රමය,

A පැරණි අධ්‍යයන ක්‍රමයක් ලෙස හඳුන්වයි.
B වඩා ප්‍රශස්ථ දේශපාලන ක්‍රමයක් හා ආයතන ගොඩනැගීම මූලික අරමුණයි.
C වර්තමානය වන විට එය ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමයක් ලෙස භාවිතා කරයි.
D ඇරිස්ටෝටල්ගේ ''දේශපාලන'' කෘතියට මෙය පදනම විය.
E විවිධ දේශපාලන ක්‍රම හා ආයතනයන්ගේ දුර්වලතා පමණක් අධ්‍යයනය කරයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(04) ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය,

A ග්‍රීකයේ සෑම නගරයක්ම පදනම් කරගෙන බිහි විය.
B සමාජ ක්‍රමය ප්‍රධාන පන්ති තුනක් පදනම් කර ගත්තේය.
C ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ලෙස රාජ්‍ය පාලන කටයුතු වෙන් කරන ලදී.
D ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළේය.
E දේශපාලන බලය හිමි වූයේ රදලයන්ට හා වහල් හිමියන්ට පමණි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(05) රාජ්‍ය පිළිබඳව විකාශනාත්මක න්‍යායට අදාළ වන්නේ,

A රාජ්‍ය බිහිවීම සමාජ විකාශනයේ ප්‍රතිඵලයක් වේ.

B රාජ්‍යයේ පැවැත්ම සදාතනික නොවන බව කියයි.

C රාජ්‍ය විකාශනයේ ප්‍රාථමික ඒකකය පවුල බව පිළිගනී.

D නූතන ජාතික රාජ්‍ය ක්‍රමය විකාශනාත්මක වාදයේ ප්‍රතිඵලයකි.

E මිනිසුන් ඒකරාශී වීම කෙරෙහි සමාජ බන්ධන බලපාන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(06) ලිබරල්වාදී රාජ්‍ය න්‍යායට ගැළපෙන්නේ,

A මිනිසුන්ගේ පොදු යහපත උදෙසා පිහිටුවා ගන්නා ලදී.

B රාජ්‍ය පොදු සංවිධානයක් ලෙස පිළිගනී.

C අවම රාජ්‍ය සංකල්පය ලිබරල් වාදයේ එක් මුහුණුවරකි.

D රාජ්‍යයේ බලය වැඩිවන තරමට මහජනයාගේ යහපතද අධික වේ.

E එය මුළුමහත් සමාජයේම අයිතිවාසිකම් තහවුරු කිරීමේ යාන්ත්‍රණය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(07) රාජ්‍ය පිළිබඳ පැසිස්ට්වාදී මතයට අදාළ වන්නේ,

A පාලකයාගේ ක්‍රියාකාරීත්වය තුළින් සමාජ යහපත සලසයි.

B ජනමාධ්‍යවලට ඉඩක් නැත.

C රාජ්‍යය යනු පාලකයාය.

D පාලකයා හැම විටම ක්‍රියාත්මක කරන්නේ නිවැරදි දේ බව අදහා ගනු ලබයි.

E මිනිසා රාජ්‍යයේ සේවකයකු ලෙස ක්‍රියා කරයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(08) රාජ්‍ය පිළිබඳ මාක්ස්වාදී මතයට ගැලපෙන්නේ,

A මිනිස් වර්ගයාගේ සමස්ත ඉතිහාසය පුරාම රාජ්‍ය පැවතී ඇත.

B එය සමාජ සුභසාධක සංවිධානයක් නොවේ.

C රාජ්‍ය පංති අරගලයේ ප්‍රතිඵලයකි.

D කොමියුනිස්ට් සමාජයක් තුළ රාජ්‍ය වියැකී යයි.

E එය ඇති නැති සංකල්පය ලොවට දායාද කළේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(09) ජාතිය හා ජනවාර්ගිකත්වයට අදාළ වන්නේ,

A නූතන ජාතික රාජ්‍යයන්ගේ නිලනාමය සැකසී ඇත්තේ ජාතිය පදනම් කරගෙනය.

B සෑම ජාතියකම ජනවාර්ගික කොටස් සිටිය හැක.

C ජනවාර්ගිකත්වයේ පිබිදීම ජාතියේ විනාශයට හේතු වේ.

D පොදු ජාතිකත්වය ගොඩනැගීමට ජනවාර්ගිකත්වය උත්සන්න විය යුතුය.

E ජාතිය හා ජනවාර්ගිකත්වය එකිනෙකට ප්‍රතිවිරුද්ධ වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(10) රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ අදහස වන්නේ,

A රාජ්‍ය හසුරවනු ලබන්නේ ආණ්ඩුව විසිනි.
B ප්‍රායෝගිකව රාජ්‍යයට උවමනා දේ ආණ්ඩුව විසින් කරනු ලබයි.
C රාජ්‍යයේ මූලික නීතිය ක්‍රියාත්මක කරන්නේ ආණ්ඩුව විසිනි.
D රාජ්‍ය සචේතනික වන අතර ආණ්ඩුව අචේතනික වේ.
E ආණ්ඩුව විවේචනවලට මුහුණ දිය යුතුය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(11) බලතල බෙදීම පිළිබඳ අදහස වන්නේ,

A සංවරණ හා තුලන ක්‍රමයක් ඒ සඳහා අනුගමනය කිරීම.
B සන්ධීය රාජ්‍යයක සන්ධීය කොටස් අතර බලය යෙදීම.
C ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණය අතර බලය බෙදීම.
D ඒකීය රාජ්‍යයක මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතන අතර බලය බෙදීම.
E ජාතික රාජ්‍ය සභාව බලය බෙදීම සඳහා උදාහරණයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(12) ඒකීය ආණ්ඩුක්‍රමයට අදාළ වන්නේ,

A ද්විත්ව පුරවැසිභාවය.
B රාජ්‍යයේ ස්වාධිපති බලය තනි මධ්‍යම ආණ්ඩුවකින් ක්‍රියාත්මක වීම.
C අවධාරිත බලය මධ්‍යම ආණ්ඩුවේ අධීක්ෂණයට යටත් වීම.
D එකම පරිපාලන රටාවක් තිබීම.
E මධ්‍යම ආණ්ඩුවට ඕනෑම අවස්ථාවක බලය පවරා ගත හැකි වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(13) සන්ධීය ආණ්ඩු ක්‍රමයට අදාළ වන්නේ,

A මධ්‍යම ආණ්ඩුවකින් හා ප්‍රාන්ත ආණ්ඩු කීපයකින් සමන්විත වීම.
B බලය බෙදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම සිදු කර තිබීම.
C විවිධත්වය තුළ ඒකීයත්වය ළඟාකර ගැනීමට උපකාරී වීම.
D ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට උපකාරී වීම.
E ආණ්ඩුවේ කාර්යයන් දෙවරක් කිරීම ඉන් අවම කරගනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(14) ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදාළ ප්‍රකාශය වන්නේ,

A එකිනෙකට වෙනස් මැතිවරණ 02 න් විධායක හා ව්‍යවස්ථාදායකය තේරී පත් වීම.
B විධායක හා ව්‍යවස්ථාදායක සබඳතා දුරස්ථ වීම.
C තම අභිමතය පරිදි කැබිනට් මණ්ඩලය තෝරා ගැනීමට අවකාශ නැත.
D ධුරයෙන් ඉවත් කිරීමේ බලය ව්‍යවස්ථාදායකට පවරා ඇත.
E අත්තනෝමතික ලෙස කටයුතු කිරීමට අවකාශ ලැබී ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(15) කැබිනට් ආණ්ඩු ක්‍රමයට අදාළ වන්නේ,

A අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් මගින් බලය ක්‍රියාවට නංවයි.

B සත්‍ය විධායකය නාමික විධායකයට වගකීමට බැඳී සිටී.

C විශ්වාසභංග යෝජනාවක් ව්‍යවස්ථාදායකය විසින් සම්මත කිරීමෙන් විධායකය ඉවත් කළ හැකිය.

D රාජ්‍ය නායකයා නාමික බලය භුක්ති විඳියි.

E එක් මැතිවරණයකින් පමණක් ව්‍යවස්ථාදායකය හා විධායකය තේරී පත් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- **පහත ප්‍රකාශ ඇසුරින් අංක 16 හා 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ව්‍යවස්ථාවේ නවාංගයකි.

(B) මන්ත්‍රීවරු තෝරා පත් කර ගැනීම සංකීර්ණ ක්‍රියාවලියකි.

(C) විශාල ඡන්ද සංඛ්‍යාවක් නොසලකා හරියි.

(D) මන්ත්‍රීවරයාට ඡන්දදායකයා මඟහරවා යාමේ හැකියාව ඇත.

(E) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් හඳුන්වා දෙන ලදී.

(F) කුඩා හා වාර්ගික දේශපාලන පක්ෂ බිහිවීමේ ප්‍රවනතාව වැඩියි.

(G) මන්ත්‍රීවරයා ඡන්දදායකයාගේ වහලෙකි.

(H) අතුරු මැතිවරණ ක්‍රමයක් ක්‍රියාත්මක විය.

(I) එකම පක්ෂය තුළ ගැටුම් උග්‍ර කරවීම දැකිය හැකිය.

(J) බහු මන්ත්‍රී ආසන දැකිය හැකිය.

(16) සමානුපාතික නියෝජන ක්‍රමයට අදාළ ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) ABDF (2) BDFI (3) ABCD (4) CDEF (5) CGHJ (......)

(17) සරල බහුතර නියෝජන ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

(1) ABDE (2) DEFG (3) DHIJ (4) CGHJ (5) DEGH (......)

- **අංක 18 සිට 25 දක්වා වූ ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතරින් එකක් පමණක් වැරදිය. වැරදි ප්‍රකාශය තෝරන්න.**

(18) ප්‍රාරම්භනය,

(1) රාජ්‍ය ව්‍යවස්ථාදායකය වඩාත් වගකීම් සහතිව නීති පැනවීමට යොමු වේ.

(2) මහජන ස්වාධිපත්‍ය වර්ධනය වේ.

(3) පක්ෂ දේශපාලනයෙන් බැහැරව පනත්වලට ජනතා ආරම්භයක් ලබා දෙයි.

(4) පනත්වල සදාචාරාත්මක වැදගත්කම ඉහළ යයි.

(5) රාජ්‍ය ව්‍යවස්ථාදායකයේ බලය හා ගෞරවය ඉහළ යයි. (......)

(19) රාජ්‍ය පරිපාලනය,

(1) ආණ්ඩුවේ විධායක හස්තයයි.

(2) ආණ්ඩුවේ ශිල්පීය අංශයයි.

(3) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම අරමුණ විය.

(4) රාජ්‍ය පරිපාලනය සඳහා වූ රාජ්‍ය යාන්ත්‍රණය වර්තමාන රාජ්‍ය තුළ අමාත්‍යාංශය තුළින් පමණක් ගොඩනගා ඇත.

(20) ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ සම්බන්ධයෙන් අදාළ නොවන වගන්තිය කුමක්ද?

(1) ලිඛිත හා දීර්ඝ ව්‍යවස්ථාවක් පැවතීම.

(2) අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි.

(3) අනම්‍ය ව්‍යවස්ථාවක් වීම.

(4) සමූහාණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් වීම.

(5) බහුතර විධායකයක් පැවතීම. (......)

(21) අන්තර් ජාතික සාමය උදෙසා අවි ආයුධ පාලනය හා නිරාකරණය,

(1) අවි ආයුධ නිෂ්පාදනය හා විකිණීම කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

(2) රාජ්‍යයන්ගේ ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටළු ඇති කරයි.

(3) එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ සඳහා දැඩි බලපෑම් කරයි.

(4) මහා බලවතුන් කුඩා බලවතුන් කෙරෙහි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරයි.

(5) න්‍යායාත්මක වශයෙන් මෙම අදහස් ඉතාමත් නිවැරදිය. (......)

(22) අන්තර් ජාතික දේශපාලනය,

(1) යුද්ධය හා සාමය පිළිබඳ අධ්‍යයනය කරයි.

(2) සෑම රාජ්‍යයක්ම එක හා සමාන නෛතික ඒකකයක් ලෙස සලකනු ලැබේ.

(3) සදාචාරාත්මක මූලධර්ම පද්ධතියකින් සමන්විත නොවේ.

(4) රාජ්‍යයන් අතර බල අරගලය යුද්ධ ඇති වීමට හේතුවේ.

(5) රාජ්‍යයන්ට නිදහසේ හැසිරීමට හැකියාව පවතී. (......)

(23) ඉන්දීය ව්‍යවස්ථාදායකය තුළ රාජ්‍ය සභාව,

(1) සාමාජිකයින් 250 කින් යුක්තය.

(2) සියළුම සාමාජිකයන් ප්‍රාන්ත රාජ්‍ය ව්‍යවස්ථාදායක මණ්ඩල නියෝජිතයන්ගෙන් සමන්විතය.

(3) නිළ කාලය වසර හයකි.

(4) සාමාජිකයන්ගෙන් 1/3 ක් අවුරුදු දෙකකට වරක් තෝරාගනී.

(5) සාමාන්‍ය පනත් ආරම්භ කළ හැකිය. (......)

(24) ප්‍රංශ ආණ්ඩු ක්‍රමයේ මූලික ලක්ෂණ,

(1) ඒකීය වේ.

(2) අනම්‍ය වේ.

(3) ලිඛිත වේ.

(4) ද්වි පක්ෂ ක්‍රමයක් ඇත.

(5) ජනාධිපති හා කැබිනට් ක්‍රමයක් සහිතය. (......)

(25) ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය,

(1) සන්ධීය සභාව ලෙස හඳුන්වයි.

(2) ද්වි මාණ්ඩලික වේ.

(3) දෙවන මණ්ඩලය ජාතික කවුන්සිලය ලෙස හඳුන්වයි.

(4) මණ්ඩල දෙකේම නිල කාලය වසර හතරකි.

(5) ඒකාබද්ධ සන්ධීය සභාවක් දැකිය හැකිය. (......)

- **අංක 26 සිට 31 දක්වා වූ ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.**

(26) බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමයේ සිදු වූ විපර්යාස යටත් විජිත දේශපාලන කෙරෙහි ඇතිකළ බලපෑම්වලට හේතු වන්නේ,

A 1906 බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ බිහි වීම.
B කොන්සර්වේටිව් හා ලේබර් පක්ෂ යටත් විජිත සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ අදහස් දැරීම.
C කොන්සර්වේටිව් පක්ෂය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිත පිළිබඳ ප්‍රගතිශීලී අදහස් දැරීම.
D 1927 දී ප්‍රගතිශීලී අදහස් දැරූ මැක්ඩොනල් මහතා කම්කරු ආණ්ඩුවක් බිහිකර ගැනීම.
E ලේබර් පක්ෂය යටත් විජිත රටවල් බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය ඒකාබද්ධ කිරීමට කැමැත්ත දැක්වීම.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(27) රාජ්‍ය පරිපාලනයේ විෂය ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රකාශ කාණ්ඩය හඳුන්වන්න.

A රාජ්‍ය නීති සම්පාදනයයි.
B සේවකයන් බඳවා ගැනීමයි.
C නීති සම්පාදනයයි.
D මූල්‍ය කළමණාකරණයයි.
E මානව සම්පත් කළමණාකරණයයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(28) අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරනු ලබන අරමුණු පිළිබඳ අදාළ වන කාණ්ඩය හඳුන්වන්න.

A ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම.
B ජාතික ආර්ථිකය ඉහළ නැංවීම.
C ජාතික සුභසාධනය පහළ දැමීම.
D ජාතික අභිමානය ආරක්ෂා කර පවත්වාගෙන යාම.
E ජාතික මතවාද ආරක්ෂාකොට පවත්වාගෙන යාම.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(29) 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපති

A ව්‍යවස්ථා නොසලකා හරිමින් විධායක බලය ක්‍රියාවට නැංවිය හැකිය.
B සත් අවුරුදු කාලයක් නිලය දරයි.
C රාජ්‍ය නායකයා පමණක් වේ.
D ඕනෑම වාර ගණනක් සඳහා ජනතාව විසින් පත්කළ හැක.
E සුළුතරයන්ට අසාධාරණයන් සිදුකරන පනත් සඳහා නිශේධ බලය යෙදිය හැකිය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(30) 1978 නියෝජන ක්‍රමය

A කුඩා පක්ෂවලට අතිරේක ආසන ලබාදෙයි.
B අතුරු මැතිවරණ සඳහා අවස්ථාව ලබාදෙයි.
C ඡන්දදායකයා තම නියෝජිතයන්ගෙන් දුරස්ථ කර ඇත.
D දේශපාලන පක්ෂ දුර්වල කර ඇත.
E මැතිවරණයේ දී ඡන්දදායකයෙකුට මනාප 4 ක් ප්‍රකාශ කළ හැකිය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(31) 1978 නියෝජන ක්‍රමය

A කුඩා පක්ෂවලට අතිරේක ආසන ලබාදෙයි.

B අතුරු මැතිවරණ සඳහා අවස්ථාව ලබාදෙයි.

C ඡන්දදායකයා තම නියෝජිතයන්ගෙන් දුරස්ථ කර ඇත.

D දේශපාලන පක්ෂ දුර්වල කර ඇත.

E මැතිවරණයේ දී ඡන්දදායකයෙකුට මනාප 3 ක් හිමි වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

- අංක 32  36 දක්වා ඇති ප්‍රශ්නවල ප්‍රකාශ අතුරින් එකක් හෝ කීපයක් නිවැරදි වේ. ඒ අනුව A හා B නිවැරදිනම් අංක 1 ද, B හා C නිවැරදිනම් අංක 2 ද, C හා D නිවැරදිනම් අංක 3 ද, D හා E නිවැරදිනම් අංක 4 ද, එකක් හෝ එකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් අංක 5 ද තිත් ඉර මත ලකුණු කරන්න.

(32) කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය

A උඩරට ප්‍රදේශ සහ මුහුදුබඩ ප්‍රදේශ සඳහා වෙන වෙනම පරිපාලන ක්‍රම සකස් කිරීම සිදුකරන ලදී.

B කෝල්බෲක් ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී.

C සීමිත ඡන්ද බලය යෝජනා කරන ලදී.

D ආණ්ඩුකාරවරයාගේ අභිමතානුසාරී බලය දුර්වල කරන ලදී. (......)

(33) බ්‍රිතාන්‍ය පාලනයේ මුල් කාල පරිච්ඡේදයේ පැනනගින ලද මධ්‍යම පන්තිය

A සාමාන්‍ය ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය වෙතට ගෙන ඒමට උනන්දුවක් නොදක්වන ලදී.

B නිදහස උදෙසා වූ එක්සත් ව්‍යාපාරයක් සංවිධානය කරන ලදී.

C සිවිල් සේවා තනතුරු පිළිබඳ උනන්දුවක් නොදැක්වීය.

D බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය තුළ අභ්‍යන්තර ස්වයං පාලනය ඉල්ලා සිටින ලදී. (......)

(34) ඩොනමෝර් කොමිෂන් සභාව

A පළාත් සභා පිහිටුවීමට යෝජනා කරන ලදී.

B දේශපාලන පක්ෂවලට වඩා විශාල භූමිකාවක් ලබාදීමට කැමති විය.

C ලාංකිකයන්ට සම්පූර්ණ වගකීමේ ආණ්ඩුක්‍රමයක් ප්‍රධානය කළේය.

D වර්ග භේදවාදී දේශපාලනය අධෛර්යමත් කිරීම අපේක්ෂා කරන ලදී. (......)

(35) 1930 ගණන්වල වාමාංශික ව්‍යාපාරය

A පූර්ණ නිදහස ඉල්ලා සිටින ලදී.

B බටහිර අධ්‍යාපනය ලද බුද්ධිමතුන් කණ්ඩායමක් විසින් ආරම්භ කරන ලදී.

C අරමුණු ඉටුකර ගැනීම උදෙසා සාමකාමී ක්‍රියාමාර්ග භාවිතා කරන ලදී.

D අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල මුලසුන දරන ලදී. (......)

(36) සෝල්බරි ව්‍යවස්ථාව ගොඩනගන ලද ප්‍රධාන ව්‍යවස්ථානුකූල ලේඛනය කුමක්ද?

A 1947 ලංකා ආණ්ඩුක්‍රම රාජාඥාව

B 1947 ස්වාධීන පක්ෂ පනත

C බාහිර කටයුතු ගිවිසුම

D ආරක්ෂක කටයුතු ගිවිසුම

E අභ්‍යන්තර කටයුතු ගිවිසුම (......)

- 37 40 දක්වා වූ ප්‍රකාශ අතුරින් හතරක් පමණක් නිවැරදිය. එම නිවැරදි ප්‍රකාශ අඩංගු පිළිතුර තෝරන්න.

(37) 1947 සිට 1977 දක්වා මැතිවරණ ක්‍රමය,

A සරල බහුතර නියෝජන ක්‍රමය ක්‍රියාත්මක විය.

B ප්‍රබල ද්විපක්ෂ ක්‍රමයක් ගොඩනගන ලදී.

C බහු මන්ත්‍රී ආසන දක්නට විය.

D අතුරු මැතිවරණ පවත්වන ලදී.

E සෑම මන්ත්‍රිවරයෙකුටම නිශ්චිත ආසනයක් නොවීය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(38) පළමු ජනරජ ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා,

A බ්‍රිතාන්‍ය රැජිණගේ මෙරට නියෝජිතයා විය.

B රාජ්‍ය නායකයා ලෙස කටයුතු කරන ලදී.

C අගමැතිගේ උපදෙස් මත කටයුතු කරන ලදී.

D සිය බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයාට වගකිව යුතුවේ.

E ජනාධිපතිවරයාගේ නිල කාලය වසර හතරකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(39) පළමු ජනරජ ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය,

A ජාතික රාජ සභාව ලෙස හඳුන්වයි.

B ද්විමණ්ඩලික ආයතනයකි.

C ත්‍රිවිධ බලතල ඒකරාශී කරගත් ආයතනයකි.

D ප්‍රාදේශීය නියෝජනය මඟින් මන්ත්‍රීවරු තෝරා පත්කරගනී.

E එහි නිල කාලය වසර හයකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

(40) පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ අධිකරණ ආයතන වන්නේ,

A ශ්‍රේෂ්ඨාධිකරණය

B මහාධිකරණය

C පළාත්බද මහාධිකරණය

D දිසා අධිකරණය

E කාති උසාවි

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......)

The National e-learning Portal for The General Education

- **පහත ප්‍රකාශ ඇසුරින් අංක 41 හා 42 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) ඔම්බුඩ්ස්මන් ධූරය හඳුන්වා දෙන ලදී.
(B) නාමික ජනාධිපතිධූරයක් ඇති කිරීම.
(C) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය.
(D) සමානුපාතික නියෝජන ක්‍රමය.
(E) අග්‍රාණ්ඩුකාරයා රාජ්‍ය නායකයා වීම.
(F) දෙවන මණ්ඩලය.
(G) ජාතික ලැයිස්තුව.
(H) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය.
(I) රාජ්‍ය සේවා උපදේශක හා විනය මණ්ඩලය.
(J) විධායක ජනාධිපතිධූරය.

(41) 1972 ව්‍යවස්ථාවේ නව අංග වනුයේ,
(1) BCEI (2) AFHI (3) CEGJ (4) BCHI (5) FGHI (......)

(42) 1978 ව්‍යවස්ථාවේ නව අංග වනුයේ,
(1) ABCJ (2) ADFJ (3) CDFJ (4) ADGJ (5) BGHI (......)

- **ප්‍රශ්න අංක 43 සිට 50 දක්වා වූ ප්‍රකාශ පහ අතුරෙන් එකක් පමණක් වැරදිය. වැරදි ප්‍රකාශය තෝරන්න.**

(43) 1978 ආණ්ඩුක්‍රමයේ ජනාධිපති හා කැබිනට් මණ්ඩලය,
(1) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියාය.
(2) අමාත්‍ය මණ්ඩලය තෝරාගනු ලබන්නේ ව්‍යවස්ථාදායකය තුළින්ය.
(3) කැබිනට් මණ්ඩල රැස්වීම් වල න්‍යායපත්‍රය සකස්කරන්නේ ජනාධිපතිවරයාය.
(4) ජනාධිපතිවරයා හැර කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයාට සාමූහිකව වගකීමට බැඳී සිටී.
(5) අගමැතිවරයා හා කැබිනට් මණ්ඩල සාමාජිකයින් තනතුරෙන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකියාව නැත.
(......)

(44) 1978 ආණ්ඩුක්‍රමය තුළ ජනාධිපති හා ව්‍යවස්ථාදායකයා
(1) ජනාධිපති ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා වේ.
(2) ජනාධිපතිවරයාට විරුද්ධව දෝෂාභියෝගී යෝජනාවක් ව්‍යවස්ථාදායකයට ගෙන ආ හැකිය.
(3) පාර්ලිමේන්තු මහලේකම්වරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත.
(4) දෝෂාභියෝගී චෝදනාවක් ඇති විට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නොහැක.
(5) විශේෂ අවස්ථාවල පාර්ලිමේන්තුව ඇමතීමේ බලය ජනාධිපතිවරයා සතු වේ.
(......)

(45) 1978 ව්‍යවස්ථාව අනුව ජනාධිපති හා අධිකරණය,
(1) ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනා අධිකරණයේ විනිසුරුවරු පත්කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත.
(2) ව්‍යවස්ථාදායකයේ අනුමැතියකින් තොරව ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් ඉවත්කිරීමේ බලය ජනාධිපතිට ඇත.
(3) වරදකරුවන්ට සමාව දීමේ බලය ජනාධිපතිවරයා සතු වේ.
(4) මහාධිකරණ විනිසුරුවරුන් පත් කිරීමේ දී අධිකරණ සේවා කොමිෂමේ නිර්දේශ අවශ්‍ය විය.
(5) ජනාධිපතිවරයාට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් උපදෙස් ලබාගැනීමේ බලය හිමි වේ.
(......)

(46) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් කළ යුතු පත් කිරීම්,

(1) නීතිපතිවරයා (2) යුධ හමුදාපතිවරයා

(3) පොලිස්පතිවරයා (4) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා

(5) පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (......)

(47) මහජන මතය,

(1) ආණ්ඩුව හා එහි ක්‍රියාකාරීත්වය පිළිබිඹු කරයි.

(2) එය හැඩගැසීම කෙරෙහි දේශපාලන පක්ෂ නායකයින්ගේ දායකත්වය ඉහළය.

(3) මහජන මතය තුළ අඩංගු වන්නේ සත්‍ය පමණි.

(4) ආණ්ඩුවක කාර්යය සාධනය මැනීමේ හොඳම දර්ශකයක් වේ.

(5) මහජන මතය සඳහා ආර්ථික සාධකය ද බලපායි. (......)

(48) ශ්‍රී ලංකාවේ පළාත් සභා,

(1) පළාත් සභා 9 කින් යුක්තය.

(2) අග්‍රාණ්ඩුකාරවරයා නාමික විධායකය ලෙස කටයුතු කරයි.

(3) ඉඩම් හා පොලිස් බලතල ප්‍රායෝගිකව ක්‍රියාත්මක වේ.

(4) මහ ඇමතිවරයා සත්‍ය විධායකය වේ.

(5) ලැයිස්තු තුනක් ඔස්සේ බලය විමධ්‍යගත කර ඇත. (......)

(49) එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉටු කරන පුළුල් කාර්ය භාරය,

(1) ජාත්‍යන්තර ආරක්ෂාව හා සාමය සඳහා කටයුතු කිරීම.

(2) මිනිස් අයිතිවාසිකම් උදෙසා කටයුතු කිරීම.

(3) නව යටත් විජිත වාදය උදෙසා කටයුතු කිරීම

(4) ජාත්‍යන්තර නීතිය උදෙසා කටයුතු කිරීම.

(5) ලෝක සෞඛ්‍යය උදෙසා කටයුතු කිරීම. (......)

(50) රටක විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු,

(1) ජාතික පැවැත්ම තහවුරු කරගැනීම.

(2) යුද්ධෝපාය වශයෙන් වැදගත් ප්‍රදේශ හෝ ස්ථාන ආරක්ෂා කර ගැනීම.

(3) දේශපාලන ආයතන හා ජාතික ඒකීයත්වය ආරක්ෂා කර ගැනීම.

(4) වෙළඳාම වර්ධනය කර ගැනීම.

(5) ආර්ථික සංවර්ධනය. (......)

(2 x 50 = 100)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# දේශපාලන විද්‍යාවේ මූලිකාංග - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- මෙම ප්‍රශ්න පත්‍රය **A, B, C** යනුවෙන් කොටස් තුනකි.
- **A** කොටස සඳහා කෙටි පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 කි.

## A කොටස

(01) වර්තමානය වන විට දේශපාලන විද්‍යාව තුළ හදාරන ක්ෂේත්‍ර 02 ක් ලියන්න.

(02) ඓතිහාසික අධ්‍යන ක්‍රමයේ දුර්වලතා දෙකක් ලියන්න.

(03) රාජ්‍යය ආණ්ඩුවෙන් වෙනස්වන සාධක දෙකක් සඳහන් කරන්න.

(04) ''මගේ සටන'', ''දෙවියන්ගේ නගරය'' යන කෘති දෙකෙහි කතෘවරු දෙදෙනා නම් කරන්න.

(05) ''මොන්ටෙස්කියු'' හා ''බ්‍රයිස් සාමි'' විසින් හඳුන්වාදෙන ලද දේශපාලන සංකල්ප දෙක සඳහන් කරන්න.

(06) අයිතිවාසිකම් හා යුතුකම් අතර ඇති සමානතා දෙකක් නම් කරන්න.

(07) ''මිනිසුන් දේශපාලනය ඉගෙනගන්නා මාර්ග දෙකකි.'' එම මාර්ග දෙක නම් කරන්න.

(08) ආණ්ඩුවේ කාර්යයන් අභ්‍යන්තර හා බාහිර වශයෙන් කොටස් දෙකකට බෙදේ. එයින් බාහිර කාර්යයන් දෙකක් ලියන්න.

(09) ද්විපක්ෂ ක්‍රමයේ පවතින වාසි දෙකක් ලියන්න.

(10) ශ්‍රී ලංකාවේ පවතින බලපෑම් කණ්ඩායම් දෙකක් සඳහා උදාහරණ සපයන්න.

(11) 1833 කෝල්බෘක් යෝජනා මඟින් වාණිජවාදී දැක්මක් ඇති කරන ලදී. එහි ප්‍රතිඵල දෙකක් නම් කරන්න.

(12) 1833 කෝල්බෘක් ප්‍රතිසංස්කරණයේ නියෝජනය යටතේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.

(13) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට විරුද්ධව පැණනැගුණු දේශීය සමාජ ව්‍යාපාර දෙකක් ලියන්න.

(14) ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය ඉන්දියානු ජාතික ව්‍යාපාරයට සාපේක්ෂව වෙනස්වන සාධක දෙකක් ලියන්න.

(15) 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය බිහිවීමට බලපෑ හේතු දෙකක් දක්වන්න.

(16) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ පැවති දුර්වලතා දෙකක් නම් කරන්න.

(17) 1935 ලංකා සම සමාජ පක්ෂය පිහිටුවාගැනීමේ දී ප්‍රකාශයට පත් කළ ප්‍රධාන අරමුණු 02 ක් ලියන්න.

(18) 1932 වාමාංශික ව්‍යාපාරයේ කාර්යයන් යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර 02 ක නම් කරන්න.

(19) ''1972 ආණ්ඩු ක්‍රමය යටතේ ජාතික රාජ්‍ය සභාව උත්තරීතර විය.'' ඒ සඳහා උදාහරණ දෙකක් සපයන්න.

(20) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහිවීමට බලපෑ පසුබිම් සාධක දෙකක් ලියන්න. (1 x 20 = 20)

## B කොටස

(01) ''දේශපාලන විද්‍යාව ශුද්ධ විද්‍යාත්මක අර්ථයෙන් විද්‍යාවක් නොවේ.'' සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(02) පහත ඒවා විමර්ශනය කරන්න.

(1) රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී මතය. (ලකුණු 10)

(2) රාජ්‍යය පිළිබඳ ෆැසිස්ට්වාදී මතය. (ලකුණු 10)

(03) පහත දැක්වෙන ඒවායින් දෙකක් පිළිබඳ විභාග කරන්න.

(1) කැබිනට් ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණ. (ලකුණු 05)

(2) ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්. (ලකුණු 05)

(3) ගැටුම් වාර්ථාකරණය. (ලකුණු 05)

(4) සමානුපාතික නියෝජන ක්‍රමයේ වාසි අවාසි. (ලකුණු 05)

(04) පහත දැක්වෙන ඒවායින් දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

(1) ඇමරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්. (ලකුණු 05)

(2) ඉන්දියානු ආණ්ඩු ක්‍රමයේ ලොග් සභාව සතු බලතල හා කාර්යයන්. (ලකුණු 05)

(3) මහා බ්‍රිතාන්‍යයේ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්. (ලකුණු 05)

(4) ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්. (ලකුණු 05)

The National e-Learning Portal for the General Education

## C කොටස

(01) ''1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මඟින් ලංකාවේ දේශීය ආර්ථිකය හා දේශපාලන රටාව පූර්ණ වෙනසකට ලක්කරන ලදී.'' සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(02) ''1931 ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරවරයා සතු බලතල වර්ධනය විය.'' විභාග කරන්න. (ලකුණු 20)

(03) පහත දැක්වෙන ඒවා විමසන්න.

(1) 1947 ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්. (ලකුණු 10)

(2) 1972 ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්. (ලකුණු 10)

(04) පහත දැක්වෙන ඒවා පිළිබඳව විවේචනාත්මකව විමසන්න.

(1) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහිවීමට බලපෑ පසුබිම් සාධක. (ලකුණු 10)

(2) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ අධිකරණය. (ලකුණු 10)